**13 ශ්‍රේණිය ව්‍යාපාර සංඛ්‍යානය - 8 වන සතිය - ජූනි 22 සිට 26 දක්වා**

**නිපුණතා මට්ටම 11.1 - දර්ශකාංක අධ්‍යයනය සඳහා මූලික පදනම ගොඩනගයි.**

- කිසියම් විචල්‍යයක වෙනස්වීම නැතහොත් විචලනය මැනීම සඳහා භාවිත කරන අනුපාතයක් හෝ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරන සංඛ්‍යාන මිනුමක් දර්ශකාංකයක් ලෙස හඳුන්වයි.
  නිදසුන්- මිල ගණන,වැටුප්,නිෂ්පාදන ප්‍රමාණ වැනි දෑහි වෙනස්වීම මැනීමට දර්ශකාංක භාවිත කරයි.

- විචල්‍යයේ වෙනස්වීම කාලය,භූගෝලීය පිහිටීම අනුව හෝ වෙනත් ලාක්ෂණිකයකට සම්බන්ධව මනිනු ලැබේ.
- මේ අනුව දර්ශකාංකයක් යනු කිසියම් විචල්‍යයක වෙනස්වීම,කාලය,භූගෝලීය පිහිටීම හෝ වෙනත් ලාක්ෂණිකයකට සම්බන්ධව මැනීම සඳහා භාවිත කරන සංඛ්‍යානමය මිනුමකි.මෙය අනුපාතයක් හෝ ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කළ හැකිය.

**අභ්‍යාස**

1.දර්ශකාංකවල ප්‍රයෝජන තුනක් ලියන්න.

2.ජීවන වියදම් දර්ශකයක ප්‍රයෝජන හතරක් ලියන්න.

3.දර්ශකාංක ගොඩනැගීමේදී මුහුණපාන ගැටළු පහක් ලියන්න.